# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# ANNUAL REPORT

# 2017

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

## முதியோர்களுக்கான தேசிய சபை

National Council for Elders

**සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය**

**சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு**

**Ministry of Socal Empowerment, Welfare and kandyan Heritageas**

# පටුන


පටුන .......... 1

පූර්විකාව .......... 3

විධායක වාර්තාව .......... 4

හැඳින්වීම .......... 5

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය .......... 6

- දැක්ම .......... 6
- මෙහෙවර .......... 6

සංවිධාන සැලැස්ම 2017 .......... 7

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2017 .......... 8

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2017 .......... 9

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2017 .......... 10

2017 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය .......... 13

- වැඩිහිටි නිවාස අලුත්වැඩියා සඳහා ආධාර සැපයීම. .......... 13
- වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම - 2017 .......... 14
- වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5000 ආධාර ලබාදීම - 2017 .......... 15
- රු. 7500 මුල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල - 2017 .......... 16
- රු. 15000 මුල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල - 2017 .......... 16
- ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන .......... 17
- වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන .......... 18
- කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු-2017 .......... 20
- ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය .......... 21
- වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය .......... 22

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති .......... 24

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව .......... 25

ආදායම් සහ වියදම් වාර්තාව .......... 26

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය .......... 27

උප ලේඛන .......... 28

විගණකාධිපතිගේ මතය .......... 31

විගණකාධිපති වාර්තාව .......... 32

විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු .......... 48

# පූර්විකාව

2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ  අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ලාංකීය වැඩිහිටි ප්‍රජාවගේ උන්නතිය උදෙසා ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රතිපත්තිමය තීරණ උපායමාර්ගික සැලසුම්වලට අනුකූලව සකස් කරයි.

2017 වර්ෂයේ ශ්‍රී ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය සාක්ෂාත් කරගැනීමෙහිලා ක්‍රියාත්මක වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කිරීම 2017 වර්ෂයේ මෙම වාර්ෂික වාර්තාවේ අරමුණයි.

පනතේ විධිවිධාන ප්‍රකාරව 2017 වර්ෂයේදී වැඩිහිටි ආත්මාභිමානය, ස්වාධීනත්වය, සහභාගීත්වය, රැකවරණයහා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර වඩාත් ඵලදායී සේවාවක් ඉටු කිරීමට ලැබීම ද වාසනාවකි.

තවද වත්මන් රජයේ  ජාතික ආණ්ඩුව යටතේ ද අතීත උරුමයේ කොටස්කරුවන් වූ වැඩිහිටියන් අතරින් අවුරුදු 70 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් දෙදහසක ප්‍රදානයක් ලබා දෙමින් තෘප්තිමත් වැඩිහිටිවියක් උදෙසා කැපවීම සතුටට කරුණකි.

# විධායක වාර්තාව

2017 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කර වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය උදෙසා කැපවී ක්‍රියා කළ අතර ඒ නිසාම 2017 වසරේ සැලසුම් කළ පරිදිම සාර්ථක භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගත හැකි විය.

වත්මන් රජයේ ජාතික ආණ්ඩු ප්‍රතිපත්තිය යටතේ අවුරුදු 70ට වැඩි වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් රුපියල් දෙදහසක ජීවනාධාර ලබා දීම ප්‍රධාන වූ අතර පැවති අභියෝග ජයගැනීමට සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ගරු අමාත්‍යතුමන් සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ මග පෙන්වීම මෙන් ම අමාත්‍ය කාර්යය මණ්ඩලය මේ පිළිබඳව දක්වන ලද උනන්දුව ද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලය ද ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන නිලධාරී පිරිසට ද විශේෂ ස්තූතිය හිමි විය යුතුය.

# හැඳින්වීම

පසුගිය දශක කිහිපය පුරා සිදු වූ සමාජ, ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන සෞඛ්‍යය, පෝෂණය හා අධ්‍යාපනය යනාදී අංශවල ක්‍රමික වර්ධනයක් දක්නට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මරණ හා උපත් අනුපාතය පහත වැටී අපේක්ෂිත ආයු කාලය ඉහළ යාම සිදුවීමත් සමග මෙරට වැඩිහිටි ජනගහණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව වර්තමානයේ 14.6% ට ආසන්න මට්ටමේ පවතින වැඩිහිටි ජනගහණය ඉදිරි දශකය තුළ දළ වශයෙන් 21% ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වැඩිහිටි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සුබසාධන පහසුකම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම කළ යුතුය.ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කැපවීමෙන් ක්‍රියා කරයි. 2017 වර්ෂයේදී වැඩිහිටි ප්‍රජාව සවිබලගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. ග්‍රාමීය වැඩිහිටි කමිටු, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල යනාදිය ලියාපදිංචි කිරීම, අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් රු. 2000 දීමනාව ගෙවීමේ කටයුතු සිදු කිරීම, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වැඩිහිටි සත්කාරකයන් පුහුණු කිරීම වැනි දෑ ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

එමඟින් වැඩිහිටියන් හුදකලාවීම වළක්වා ඔවුන්ගේ සමාජ සහභාගීත්වය වර්ධනය කිරීමත්, කායික, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමත් අපගේ අභිප්‍රාය වේ.

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ
පනත යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.


## දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුලින් ක්‍රියාකාරී, ජවසම්පන්න හා
ඵලදායී වැඩිහිටි දිවියක් උදාකිරීම


## මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය හා
අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන කාර්යයන්හි
වැඩිහිටියන්ගේ සහභාගීත්වය උනන්දු කරවීමත් හා
දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින්
වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැකදීමත්
අපගේ මෙහෙවර වේ.

# සංවිධාන සැලැස්ම 2017



# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2017




| | නම | තනතුර |
|---|---|---|
| 1. | ශිරාණි වීරකෝන් මහත්මිය | සභාපති |
| 2. | එස්.ඩී. උඩවත්ත මයා | උප සභාපති |
| 3. | සුවින්ද.එස්.සිංගප්පුලි මහතා | ලේකම් |
| 4. | වජිර කඹුරුගමුව මහතා | කමිටු සාමාජික |
| 5. | තිලක් ද සොයිසා මහතා | කමිටු සාමාජික |
| 6. | මහින්ද රණසිංහ මහතා | කමිටු සාමාජික |
| 7. | ආචාර්ය නීලා පියසීලි ගුණසේකර මහත්මිය | කමිටු සාමාජික |
| 8. | ඊ.එම් රත්නදාස මහතා | කමිටු සාමාජික |
| 9. | ඇලිකේවල සිලානන්ද හිමි | කමිටු සාමාජික |
| 10. | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්. දිසානායක මහතා | කමිටු සාමාජික |
| 11. | පාලිත ඇල්කඩුව මහතා | කමිටු සාමාජික |
| 12. | සුනිල් ගුණවර්ධන මහතා | කමිටු සාමාජික |
| 13. | ඩී.එම්.සී.සී කේ ගුණරත්න මහත්මිය | කමිටු සාමාජික |
| 14. | මාලර් ගන්ගාදරන් මහත්මිය | කමිටු සාමාජික |
| 15. | වෛද්‍ය ශිරෝමි මාදුවගේ මහත්මිය | කමිටු සාමාජික |
| 16. | මහාචාර්ය ශිරාණි රණසිංහ මහත්මිය | කමිටු සාමාජික |

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව 2017

80 දශකයෙන් ආරම්භ වූ වැඩිහිටි ජනගහනය වර්ධනය වීම අද වනවිට සමාජ ගැටලුවක් වන තරමට වර්ධනය වී ඇත. දිනෙන් දින සීග්‍රයෙන් වැඩිහිටි ජනගහනය ඉහළ යමින් පැවතීම අනාගතයේ ගැටලුවක් නොවනු පිණිස වැඩිහිටි ප්‍රජාවගේ සුබසාධනය හා රැකවරණය උදෙසා සැලසුම් සම්පාදනය කිරීමේ ප්‍රධාන වගකීම අප අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

මෙම කර්තව්‍ය ඉටු කිරීම සඳහා " 2011 අංක 05 දරන පනතින් සංශෝධිත, 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් " ලැබී ඇති බලතල අනුව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සිදු කරනු ලබයි. ඒ අනුව එම කාර්යයන් ඉටු කිරීමට පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් විවිධාකාර වැඩසටහන් රාශියක් සංවිධානය කරමින් ක්‍රියාත්මක කරන අතර 2017 වර්ෂයේදී ද වැඩිහිටි සුබසාධන සේවා වඩාත් පුළුල් අර්ථයකින් සාධනීය ප්‍රතිඵල අපේක්ෂාවෙන් දියත් කරන්නට යෙදුනි.

මෙම කාර්යභාරය ඉටු කිරීමෙහිලා ප්‍රධාන වගකීම දරණ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවත් , ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයත් කැපවීමෙන් කරන සේවය අගය කළ යුතු අතර සෙසු පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානත් තම කාලය හා ශ්‍රමය වැඩිහිටි ප්‍රජාවේ උන්නතිය වෙනුවෙන් කැපකරමින් කරනා මෙහෙවර අගය කරන අතර මාගේ කෘතඥතාව මේ සියලු දෙනා වෙත පුද කර සිටිමි.

එසේ වුවද මේ වනවිට ලංකාවේ මිලියන 3 කට අධික වැඩිහිටි ජනගහනයේ සුබසාධනය හා ආරක්ෂාව මෙවැනි ආයතනයකට සීමා කරමින් ඉටු කිරීම මහත් අභියෝගයක් මෙන් ම අසීරු කාර්යයක් වන හෙයින්, ආර්ථික ස්ථායිතාවක් සහිත පවුල මූලික කේන්ද්‍රස්ථානය වූ සමස්ත සමාජය විසින් සීඝ්‍රයෙන් ඉහළ යන වැඩිහිටි ජනගහනයේ සුබසාධනය හා ආරක්ෂාවට කැපවී වැඩිහිටියන් සඳහා සුරක්ෂිත හෙට දිනක් බිහි කිරීම වෙනුවෙන් කටයුතු කිරීමට කාලය එළඹ ඇති බව මාගේ හැඟීමයි .

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

සභාපති

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2017

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණ හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ අත්කර ගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.

**1. රු. 2000 ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව**

වයස අවුරුදු 70 ඉක්ම වූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රැකවරණය සහ සුභසාධනය සැලසීමේ අරමුණින් වයස අවුරුදු 70ට වැඩි අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 386083 කට පමණ 2017 වර්ෂයේදී රු. 2000/- දීමනාව ලබා දී ඇති අතර ඒ වෙනුවෙන් රු.මි 9266 ක් වෙන් කරනු ලැබ ඇති අතර 9010.03 ක වියදමක් දරා ඇත.

**2. ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම හා මූලායාධාර සැපයීම.**

ග්‍රාමීය වැඩිහිටි කමිටු 229 ක් ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල 02ක් ද, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 01 ක් පලාත් මට්ටමේ රැස්වීම් 01 ක්, ජාතික මට්ටමේ රැස්වීම් 01ක්, අත්දැකීම් හුවමාරු වැඩසටහන් 01 ක් හා ආගමික චාරිකා වැඩසටහන් 01 ක් වෙනුවෙන් ද, රුපියල් මිලියන 1.4983 ක මුදලක් වැය කොට ඇත.

**3. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.**

වර්ෂය තුළ රුපියල් මිලියන 0.4679 ක වියදමක් දරා වැඩිහිටියන් 45156 කට වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කරන ලදී.

**4. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්**

වැඩිහිටියන් වෙනුවෙන් ව්‍යායාම වැඩසටහන් 02 ක් සිදු කිරීම ද සංගීත උපදේශන වැඩසටහන් 10 ක් සිදු කිරීම ද කාන්තා දින සැමරුම් වැඩසටහන් 01 ක් ද මාධ්‍ය වැඩසටහන් 01 ක් ද, ජනගහනය හා තිරසාර සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදය පැවැත්වීම, තිරසර ලංකා ප්‍රදර්ශනයට සහභාගිත්වය හා දැනුවත් කිරීම් සිදු කිරීම, පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 07 ක් ද, විශ්‍රාම පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් 07 ක් ද, ස්ටිකර් ඇලවීම මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් 01 ක් ද, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර ප්‍රගති සමාලෝචන රැස්වීම් 03, දිස්ත්‍රික් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර ප්‍රගති සමාලෝචන රැස්වීම් 02, දිස්ත්‍රික් වැඩිහිටි බල මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 01 ක් ද,වැඩිහිටි සාත්තු සත්කාරක සේවා සම්මුඛ පරීක්ෂණ හා පුහුණු වැඩසටහන පැවැත්වීම (NVQ 02 මට්ටම ) සිදු කර ඇති අතර පුහුණු කරන ලද ප්‍රමාණය 17 කි. සාත්තු සත්කාරක සේවා ටී ෂර්ට් හා කැප් 250 ක් ද යනාදිය වෙනුවෙන් රු. මිලියන 3.9491 ක මුදලක් වැය කර ඇත.

**5. නොමිලයේ අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම.**

2017 වර්ෂය තුළ වෛද්‍ය සායන 09 ක් පවත්වා ඇත. වැය වූ මුදල රුපියල් මිලියන 0.7034 කි.

**6. ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම**

"වැඩිහිටියන්ගේ හැකියාවන්, දායකත්වය සහ සහභාගිත්වය තුළින් අනාගතයට පියනගමු " යන තේමාව යටතේ 2017 වැඩිහිටි දින සැමරුම් උත්සවය, 2017.10.01 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා දිවයිනේ නන් දෙසින් පැමිණි වැඩිහිටියන්ගේ සහභාගිත්වයෙන් පවත්වන්නට යෙදුන අතර, එම උත්සවයට සමගාමීව අවුරුදු සියයට වැඩි වැඩිහිටියන් පිදීම, අවුරුදු 75 ට වැඩි හා වැඩිම දරුවන් ප්‍රමාණයක් සිටින දෙමාපියන් පිදීම, සමෘද්ධි ළමා සමාජ මට්ටමින් දරුවන් වෙනුවෙන් දැනුම මිනුම තරඟාවලියක් පැවැත්වීම ද , හොඳම වැඩිහිටි නිවාසය තේරීම ද,"ආදරයයි කරුණාවයි - ළමා අපේ වැඩිහටි ලෝකයයි" නමින් පාසල් දරුවන් අතර නිර්මාණාත්මක තරඟාවලියක් පැවැත්වීම හා ජයග්‍රාහකයන් ඇගයීමට සහතික පත්‍ර හා ත්‍යාග ලබා දීම වෙනුවෙන් ද ආදි විවිධ අංගයන් පවත්වන ලද අතර ඒ සියල්ල සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 16. 3435 කි.

***7. වැඩිහිටි නිවාසවලට මූලාධාර ලබාදීම.***

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පාලක සභාව විසින් කළමනාකරණය කරනු ලබන කතරගම වැඩිහිටි නිවාසය සහ සංචාරක නිකේතනය ද මාලිගාතැන්න එච්පින් නෝනා අනුස්මරණ වැඩිහිටි නිවාසය ද ඇතුලත්ව වැඩිහිටි නිවාස 10ක් සංවර්ධනය කිරීම් සඳහා රුපියල් මිලියන 2.3731 ක මුදලක් වැයකර තිබේ.

**8. වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන**

දානපතියන්ගේ පරිත්‍යාග තුළින් 2017 වර්ෂයේදී එක් අයෙකුට මසකට රු. 500/- ක් වන පරිදි වැඩිහිටියන් 13 දෙනෙකුට ද, රු.250 බැගින් වැඩිහිටියන් 22 දෙනෙකුට ද අඛණ්ඩව මුදල් ආධාර ලබාදීමට හැකිවී තිබේ.

**9. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය**

වර්ෂය තුළ මණ්ඩලය 50 වාරයක් රැස්වී ඇති අතර, වැඩිහිටියන්ගේ පැමිණිලි 168 ක් අතරින් පැමිණිලි 63ක් විසඳා අවසන් කරන ලදී. ඒ අනුව නඩත්තු මණ්ඩලයේ කටයුතු සඳහා 2017 වර්ෂයේදී රුපියල් මිලියන 1.0031 ක් වැය කොට ඇත.

**10. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව**

2017 වර්ෂයේදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව රැස්වීම් වාර 09 ක් පවත්වා ඇති අතර විගනන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් ද පවත්වා ඇති අතර වැයවූ මුදල රුපියල් මිලියන 1.0489 කි

**11. ප්‍රකාශන**

**2017** වර්ෂය තුලදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා බැනර් 25 ලබා දීම, වැඩිහිටියෝ සඟරාව පිටපත් 1500 ක් මුද්‍රනය ද , වැඩිහිටියෝ ත්‍රෛමාසික පුවත්පත පිටපත් 3000 ක් මුද්‍රනය කිරීම ද (කළාපයකට පුවත්පත් 1000 බැගින් කළාප 03), සාර්ථක වැඩිහිටි දිවියට මඟ (අත්පොත් ) 2500 ක් මුද්‍රනය කිරීම ද , වැඩිහිටි ස්වයං තොරතුරු වාර්තා අත්පොත පිටපත් 6000 ක් මුද්‍රනය කිරීම ද, 2015 හා 2016 වාර්ෂික වාර්තා පොත් හා සීඩි මුද්‍රනය කිරීම ආදිය සිදුකර ඇති අතර ඒ වෙනුවෙන් වැය වී ඇති සමස්ත මුදල රු.මිලියන 1.6862 කි.

2017 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් යටතේ රු. මිලියන 20 ක් ද පුනරාවර්ථන වියදම් යටතේ රු. 130 ක ප්‍රතිපාදන වෙන්කරන ලද නමුත්, අක්මුදල් වශයෙන් ලැබී තිබෙන්නේ රු. මිලියන 12.7 ක් හා රු. මිලියන 112.402 පමණි. කෙසේ නමුත්, 2017 වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් යටතේ රු. මිලියන 110.195 ක මුදලක් ද ප්‍රාග්ධන වියදම් යටතේ රු. මිලියන 6.149 ක් වැඩිහිටි සුබසාධන කටයුතු සඳහා සෘජුව වැය කර ඇත.

එස්.ඩී උඩවත්ත
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# 2017 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය

## වැඩිහිටි නිවාස අලුත්වැඩියා සඳහා ආධාර සැපයීම.

| *දිස්ත්‍රික්කය* | *වැඩිහිටි නිවාසය* | *ගෙවන ලද මුදල (රු)* |
|---|---|---|
| මහනුවර | කොට්කාම්බ වැඩිහිටි නිවාසය | 25,000.00 |
| | මහයියාව වැඩිහිටි නිවාසය | 84,652.00 |
| කුරුණෑගල | මහව මීමුත්තා වැඩිහිටි නිවාසය | 197,875.00 |
| | දන්කොටුව විද්‍යාබන්දු වැඩිහිටි නිවාසය | 161,875 .00 |
| කළුතර | මතුගම වෑත්තෑව පිරිමි වැඩිහිටි නිවාසය | 114,000.00 |
| මොණරාගල | පිළිසරණ වැඩිහිටි නිවාසය | 172,572 .33 |
| කෑගල්ල | සිංහ සෙවන වැඩිහිටි නිවාසය | 237,000 . 00 |
| | **වියදම** | **992,974. . 33** |
| මොණරාගල | කතරගම වැඩිහිටි නිවාසය | 1,045,552 .92 |
| ගම්පහ | මල්වතු හිරිපිටිය එච්පිජින් නෝනා වැඩිහිටි නිවාසය | 257,895 .61 |
| | **මුළු වියදම** | **2,296,422 .86** |

# වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම - 2017

| පළාත | දිස්ත්‍රික්කය | හැඳුනුම්පත් සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 2276 |
| | කොළඹ | 2338 |
| | ගම්පහ | 4264 |
| මධ්‍යම | මාතලේ | 730 |
| | නුවරඑළිය | 2042 |
| | මහනුවර | 4112 |
| දකුණ | හම්බන්තොට | 1906 |
| | ගාල්ල | 3346 |
| | මාතර | 2266 |
| නැගෙනහිර | මඩකලපුව | 765 |
| | අම්පාර | 1421 |
| | ත්‍රිකුණාමලය | 687 |
| වයඹ | කුරුණෑගල | 3109 |
| | පුත්තලම | 1935 |
| උතුරු මැද | අනුරාධපුර | 1616 |
| | පොළොන්නරුව | 834 |
| ඌව | බදුල්ල | 1539 |
| | මොණරාගල | 1110 |
| සබරගමුව | රත්නපුර | 2113 |
| | කෑගල්ල | 4043 |
| උතුර | යාපනය | 739 |
| | මන්නාරම | 572 |
| | මුලතිව් | 356 |
| | කිලිනොච්චි | 226 |
| | වවුනියාව | 723 |
| **එකතුව** | | **44803** |
| ප්‍රධාන කාර්යාලයෙන් ජංගම සේවාවලදී නිකුත් කළහැඳුනුම්පත් සංඛ්‍යාව | | 353 |
| **නිකුත් කළ මුළු හැඳුනුම්පත් ගණන** | | 45156 |

# වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5000 ආධාර ලබාදීම - 2017

| පළාත | දිස්ත්‍රික්කය | රු 5000 ආධාර ලබාදුන් කමිටු සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 4 |
| | කොළඹ | 12 |
| | ගම්පහ | 14 |
| මධ්‍යම | මහනුවර | 18 |
| | මාතලේ | 4 |
| | නුවරඑළිය | 22 |
| දකුණ | ගාල්ල | 25 |
| | මාතර | 04 |
| | හම්බන්තොට | 05 |
| උතුර | මුලතිවු | 07 |
| | යාපනය | 53 |
| | වවුනියාව | 01 |
| නැගෙනහිර | මඩකලපුව | 12 |
| | අම්පාර | 15 |
| | ත්‍රිකුණාමලය | 05 |
| වයඹ | පුත්තලම | 04 |
| සබරගමුව | රත්නපුර | 06 |
| | කෑගල්ල | 04 |
| උතුරු මැද | අනුරාධපුරය | 12 |
| ඌව | බදුල්ල | 02 |
| ***එකතුව*** | | **229** |

## රු. 7500 මුල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල - 2017

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
|---|---|---|
| නැගෙනහිර | අම්පාර | 01 |
| | මඩකලපුව | 01 |
| **එකතුව** | | 02 |

## රු. 15000 මුල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල - 2017

| පළාත | දිස්ත්‍රික්කය | බලමණ්ඩල ගණන |
|---|---|---|
| උතුර | යාපනය | 01 |
| **එකතුව** | | **01** |

## ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන

වැඩිහිටියන් සඳහා අවශ්‍යවන්නා වූ රැකවරණය හා හෙද සත්කාර සේවා ලබාදීමේ අරමුණෙන් වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවකයන් පුහුණු කර සේවයේ යෙදවීමේ වැඩසටහනක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත. ඒ අනුව තෝරා ගන්නා ලද පිරිසක් හට වැඩිහිටියන් රැකබලාගැනීම හා ඔවුන්ට සෞඛ්‍යමය සේවා සැපයීම පිළිබඳ සති තුනක විධිමත් පුහුණුවක් ලබාදී ඇති අතර, මේ වන විටවිශේෂයෙන්ම බස්නාහිර පළාත තුල ජීවත් වන අවශ්‍යතාවය ඇති වැඩිහිටියන්ට ඔවුන්ගේ සේවය ලබා ගැනීමට මාහැඟි අවස්ථාවක් උදාවී තිබේ. ඒ සඳහා දිවා කාලයේ පැය 08 ක වැඩමුරයකට රු.750.00 බැගින් ද රාත්‍රි වැඩමුරයකට රු.900.00 බැගින් ද හා පැය 24 ක වැඩමුරයකට රු.1650.00 ක නියමිත ගාස්තුවක් පමණක් අයකරනු ලැබේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පූර්ණ අධීක්ෂණය යටතේ සේවාව සපයන අතර, සේවාලාභීන්ගේ අවශ්‍යතාවය පරිදි සේවාදායකයකු ලබාගත හැක. එසේම සේවයේ යොදවන සියලුවැඩිහිටි සත්කාරකයන් ආචාරධර්ම පද්ධතියකට යටත්ව කටයුතු කරති.
සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව පුහුණු වැඩසටහන සැළසුම්කර මෙහෙයවන අතර පුහුණුව සාර්ථකව අවසන්කරන පුහුණුවන්නන්ට විධිමත් සහතික පත්‍රයක් හා හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ. එහෙයින් වඩාත් විශ්වාසයකින් යුතුව එකී රැකවරණ ස්වෙච්ඡා සේවකයන්ගේ සේවය තුළින් ලබා ගැනීමට හැකි වී ඇත.

මෙකී වැඩපිළිවෙල නිසා වැඩිහිටියන්ට හා ඔවුන්ගේ පවුල්වලට පමණක් නොව රජය පිළිගත් පුහුණුවකින් පසු වටිනා සහතිකයකට හිමිකම් ලැබීම හා ස්වාධීන උපස්ථායකයෙකු ලෙස සේවය කරමින් ආදායම් ඉපයීමට හැකි වීම නිසා වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවක පුහුණුව ලැබූවන්හට ද යහපතක් සැලසී තිබේ.

දැනට බස්නාහිර පළාත කේන්ද්‍රකොට ගෙන මෙකී වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවාව ක්‍රියාත්මක වුවද ඉදිරියේදී අනෙකුත් පළාත්වලට ද එය ව්‍යාප්ත කිරීමෙන් සේවා අවශ්‍ය වැඩිහිටියන් සඳහා වඩාත් පුළුල් සේවාවක් ලබාදීමට අදහස් කර තිබේ.

# වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ යෝජනාවක් පරිදි ඉතාමත් අසරණ දිළිඳු තත්වයේ පසුවන අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන්ට පිළිසරණක් වීම අරමුණු කොට ගෙන මෙම වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඕනෑම අයෙකුට මුදල් පරිත්‍යාග කළ හැකි වන අතර, එසේ පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන මුදල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගන්නා ලද ඉතාමත් දිළිඳු අසරණ වැඩිහිටියන් වෙනුවෙන් මසකට රුපියල් 250/- බැගින් ලබාදීමට කටයුතු කර තිබේ. ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබාදීමේදී මාස 4 කට වරක් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු. 1000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදීම සිදු කරන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ප්‍රතිලාභියා වෙත මුදල් ලබා දීම සිදු කරනු ලැබේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින අපගේ නිලධාරියෙකු (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර /සමාජ සේවා නිලධාරී) සෑම තුන් මසකට වරක් මෙම ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු සොයා බලනු ලබන අතර ප්‍රතිලාභීන්ට මුදල් ලබා දෙන සෑම අවස්ථාවකම පරිත්‍යාගශීලීන්ව දැනුවත් කරනු ලබයි.

එසේම මෙම වැඩසටහන යටතේ ආධාර ලබාදීමේදී තමන් කැමති අයෙකු හෝ කිප දෙනෙකු තෝරා ගැනීමට හෝ තමන් කැමති ප්‍රදේශයක අයෙකු හෝ කිහිප දෙනෙකු නම් කිරීමට පරිත්‍යාගශීලියාට ද හැකියාව ඇත. එසේ නොමැති නම් එම තෝරාගැනීම මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලබන අතර, ප්‍රතිලාභියාගේ නම, ලිපිනය ඇතුලත් තොරතුරු පරිත්‍යාගශීලියා වෙත ලබාදිමට අප කාර්යාලයෙන් කටයුතු කරනු ඇත.

මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදිමට කැමති අයෙකු වේ නම් බත්තරමුල්ල ලංකා බැංකුවේ අංක 5234881 දරණ වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ගිණුමට ඔබගේ පරිත්‍යාග මුදල් ලබාදිය හැකි අතර, එසේ මුදල් තැන්පත් කිරීමේදි මුදල් තැන්පත් කළ ලදුපතේ පිටපතක් අප වෙත ලබාදිය යුතුය. එසේත් නොමැති නම්, අප කාර්යාලයට පැමිණ ඔබගේ මුදල් පරිත්‍යාග ලබාදිය හැක.

මෙය අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සිදුකරනු ලබන මහගු පුණ්‍ය කටයුත්තක් වන බැවින් එය තවදුරටත් ව්‍යාප්ත කරමින් වැඩිහිටියන් විශාල පිරිසකට මෙම වැඩසටහනින් සේවයක් සැලසීමට අදහස් කර තිබේ.

ඒ අනුව 2017 වර්ෂයේදී වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහනේ පරිත්‍යාගශීලීන්, ප්‍රතිලාභීන් හා අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහත සඳහන් කර ඇත.

| අංකය | දායකයාගේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිලාභියාගේ නම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|---|
| 01 | ඩබ්.එම් වත්සලා මිය | 01 | ජී අස්පත්තිනියේ මිය | පාතදුම්බර |
| 02 | ප්‍රේමා ගුණදාසමිය උදයාංගනි ගුණදාසමිය | 02 | එම්.කේ.ජී සෝමා ගුණවර්ධන මිය | මිනුවන්ගොඩ |
| | | | එච්.පී විපුලසේන මයා | මිනුවන්ගොඩ |
| 03 | ගිණුම | 23 | එම්.පී වයලට් මිය | තඹුත්තේගම |
| | | | ඩී.එම්.ඩිංගිරි අම්මා මිය | මාස්පොත |
| | | | ආර්.ජී. කැරලයින් නෝනා මිය | මිහින්තලය |
| | | | බී.ඩී. ජේන්නෝනා මිය | රිදීගම |
| | | | ටී.ඩබ්.පී. අංගෝ මිය | මාවනැල්ල |
| | | | ඩබ්.පී. ගුණවති මිය | කුණ්ඩසාලේ |
| | | | ආර්.ඇසිලින් නෝනා මිය | කඩුවෙල |
| | | | ඊ.පියසීලි මිය | කඩුවෙල |
| | | | එම්.ඒ හේමලතා පෙරේරා මිය | මහරගම |
| | | | පී.ජී පියසේන මයා | |
| | | | එච්.ඩී ලීලාවති මිය | මහකුඹුක්කඩවල |
| | | | එම් එම්. .ඩී. මැණික්හාමි මිය | ගිරිබාව |
| | | | එච්.එම් හේරත් මැණිකේ මිය | ඉබ්බාගමුව |
| | | | ඒ.පී ධර්මවර්ධන මයා | දැරණියගල |
| | | | අයි.පී සොයිදා මිය | වරකාපොල |
| | | | ජේ.පී ලැයිසා මිය | වරකාපොල |
| | | | ආර්.සී විනි මිය | ගිරිබාව |
| | | | කේ.ආර්.ඩිංගිරි මයා | පොල්ගහවෙල |
| | | | ඒ.හේමපාල පෙරේරා මයා | මහරගම |
| | | | එස්.ඩබ්. පීරිස් ස්ටීවන් ප්‍රනාන්දු මයා | චාවකච්චේරි |
| | | | වර්ණපුලිගේ නන්දදාස | සීතාවක |
| | | | එච්.කුසුම් පෙරේරා මිය | සීතාවක |
| | | | පනවැන්නගේ ප්‍රීතිලතා මිය | සීතාවක |
| 04 | නන්දා කරුණාසේන මිය | 01 | පී.එම්. ලිලි මිය | කැළණිය |
| 05 | තරංගා කරුණාසේන මිය | 02 | කේ. මේරිනෝනා මිය | කැස්බෑව |
| | | | අයි.ඇන්සි නෝනා මිය | කැළණිය |
| 06 | ජයන්ත පිංචිහේවා මයා | 01 | එම්.නෝබට් විමලසේන මයා | කැස්බෑව |
| 07 | නදීර කරුණාසේන මයා | 02 | ඩබ්.ඩී.ධර්මදාස මයා | මහරගම |
| | | | ඩබ්.ජී ඩබ් රෙජිනෝල්ඩ් මයා | මහරගම |
| 08 | ලලනි පෙරේරා මිය | 02 | පී.ආර් සාදිනෝනා මිය | වරකාපොල |
| | | | කේ.එම්.බණ්ඩාර මැණිකේ මිය | පාතහේවාහැට |
| 09 | ශාන්ති වැඩිහිටි සමිතිය හිඟුරක්ගොඩ | 01 | ඊ.පී ඩිංගිරි බණ්ඩා මයා | දෙල්තොට |

## කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු-2017

| මාසය | කාමර වෙන් කළ ප්‍රමාණය | ආදායම රු. | වියදම් | | |
|---|---|---|---|---|---|
| | | | ජල බිල්පත් රු. | විදුලි බිල්පත් රු. | වෙනත් |
| ජනවාරි | අලුත් වැඩියා කටයුතු සිදු කිරීම නිසා නවාතැන් පහසුකම් ලබා දීම සිදු කලේ නැත | | 7,251.07 | 439.90 | |
| පෙබරවාරි | | | 6,947.63 | 459.60 | |
| මාර්තු | | | 5,855.60 | 258.20 | |
| අප්‍රේල් | | | 8,072.65 | 423.00 | |
| මැයි | | | 5,831..60 | 313.20 | |
| ජූනි | | | 6,177.17 | 240.00 | |
| ජූලි | | | 4,669.35 | 368.10 | |
| අගෝස්තු | 16 | 30,750.00 | 5,166.17 | 5,600.60 | - |
| සැප්තැම්බර් | 10 | 22,500.00 | 17,364.47 | 3,588.90 | - |
| ඔක්තෝබර් | 06 | 10,750 | 11,246.00 | 1,392.90 | - |
| නොවැම්බර් | 08 | 15,875.00 | 11,563.63 | 1,685.70 | - |
| දෙසැම්බර් | 39 | 75,000.00 | 10,704.97 | 4,211.10 | - |
| ***එකතුව*** | ***79*** | ***154,875.00*** | ***100,850.31*** | ***18,982.20*** | **-** |

# ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ 2007 ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිත්තෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය කළ අතර, එය 2008 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා පත් කර ගනු ලබන වයස අවුරුදු 70 ඉක්මවූ තම දරුවන් ඥාතීන් විසින් නොසලකා හැර ඇති, රජයේ විශ්‍රාම වැටුප්, වැන්දඹු විශ්‍රාම වැටුප්, අර්ථසාධක අරමුදල්, ගොවි ධීවර හෝ ස්වයං රැකියා විශ්‍රාම වැටුප් හෝ වෙනයම් සමාජ රක්ෂණ යෝජනා ක්‍රමයක දායකත්වය නොලබන ඉතා අසරණ වූවන් මේ සඳහා දායක කර ගනු ලබන අතර, දිගු කාලීන අසනීප හා ආබාධ සහිත පුද්ගලයන් වෙත ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය අරමුදල් ලෙස රුපියල් මිලියන 03 ක මුදලක් සුපිරි වාසනා ලොතරැයි අරමුදලින් ලබාදී ඇති අතර, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් එකී මුදල ආයෝජනය කර මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරයි.

සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මසකට රුපියල් 500/- බැගින් ප්‍රතිලාභීන් 50 දෙනෙකු සඳහා මෙම ප්‍රතිලාභ ලබා දෙන ලදී.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සභාපති ඇතුළු සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. වර්තමානයේ මෙහි සභාපති වනුයේ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකි.

මෙහි කාර්ය භාරය වන්නේ දරුවන් විසින් නොසලකා හැර ඇති, වයස අවුරුදු 60 ඉක්ම වූ, වියපත් දෙමාපියන්ට එම නොසලකා හැර ඇති දරුවන්ගෙන් ජීවත්වීම සඳහා යම් නඩත්තු මුදලක් ලබා දීමය. ඒ අනුව, මෙම දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන්ගෙන් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ලැබුනු අවස්ථාවකදී, මණ්ඩලය විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව දෙපාර්ශවයම කැඳවා කරුණු විමසා පරීක්ෂණයක් සිදු කොට දෙමාපියන්ගේ මාසික යැපීමට ප්‍රමාණවත් වන නඩත්තු මුදලක් නියම කිරීම සිදු කරනු ලබයි. එලෙස තීරණය කිරීමේදී දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේද ආදායම්, යැපීම් අවශ්‍යතා ආදී සියළු සාධක සැලකිල්ලට ගැනීම සිදු කරනු ලබයි.

මෙහිදී දෙමාපියන් නඩත්තු ඉල්ලීමේදී තම දරුවන්ගෙන් මෙන්ම තමන් විසින් දරුකමට හදා ගන්නා ලද දරුවන්ගෙන්ද (Adoped Child) නඩත්තු ඉල්ලීමට හැකියාවක් ඇත. තවද යම් දෙමාපියෙකුගේ වයස අවුරුදු 60 නොඉක්මවනු ලැබුව ද ඔහු/ඇය තම එදිනෙදා නඩත්තු සපයා ගැනීමට නොහැකි නිසා ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙලෙන්නේ නම් මෙම පනතේ 24(I) වගන්තිය යටතේ නඩත්තු ඉල්ලා සිටීමේ හැකියාව පවතී.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම්පත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමේ පහසුකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සපයා ඇත.

නමුත්, මෙම මණ්ඩලයට පවුල් ආරවුල් මෙන්ම ඉඩකඩම් හෝ දේපල සම්බන්ධයෙන් පවුල් අතර පවත්නා ගැටළු විසඳීමට පනත යටතේ නෛතික බලයක් නැත.

මෙම නඩත්තු මණ්ඩලය විසින් ලබා දෙන යම් නඩත්තු ගෙවීමක් පිළිබඳ නියෝගයක් යම් දරුවකු විසින් පැහැරහරින අවස්ථාවකදී පනතේ 32 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට එම තීරණය බලාත්මක කරවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කිරීමේ හැකියාව පවතී. එහිදී මහේස්ත්‍රාත් වරයෙකුට එම නියෝගය නඩත්තු අඥාපනත යටතේ කරන ලද අඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය - 2017

| | |
|---|---|
| 2017වර්ෂයේ ලැබී ඇති පැමිණිලි | - 168 |
| ඉඩම් පවුල් ආරවුල් වැනි අදාල නොවන පැමිණිලි | - 10 |
| ඒ අනුව අවසානය තෙක් විභාග කළ පැමිණිලි | 99 |

| | |
|---|---|
| මණ්ඩලය විසින් සමථයට පත් කළ පැමිණිලි | - 63 |
| විවිධ හේතූන් මත නිශ්ප්‍රභා කළ හා ඉඩ ලබා දිය නොහැකි පැමිණිලි | - 24 |
| ඉල්ලා අස්කරගන්නා ලද පැමිණිලි | - 12 |
| දැනට විභාගවෙමින් පවතින පැමිණිලි | - 54 |

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයේ සාමාජිකයින්

සභාපති - ඩඩ්ලි කරුණාරත්න මයා

ලේකම් - එම්. පී. පුංචිබණ්ඩා මයා

**මණ්ඩලයේ සාමාජික**

1. ඞී.එල්.ආර්. සුභසිංහ මයා
2. ආචාර්ය ලීල් ගුණසේකර මයා
3. කේ. මර්කණ්ඩු මයා
4. ඒ. ආර්. ඒ. එම්. ලාෆීර් මයා

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති

**පොදු ගිණුම් ප්‍රතිපත්ති**

(1) මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ඒවා පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව පිළියෙළ කර ඇත.(SLPSAS)

(2) උපචිත පදනම මත සකස් කර ඇත.

(3) රජයේ ප්‍රදානයන්

(3.1) ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙන් වන අතර, මෙම ආයතනය ලාභ නොලබන ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලබයි.

මහාභාණ්ඩාගාරය විසින් පුනරාවර්ථන වියදම් සඳහා දෙනු ලබන ප්‍රදානයන් ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු ලබන අතර, මූලධන වියදම් සඳහා දෙනු ලබන ප්‍රදානයන් මූලධන ප්‍රදානයක් ලෙස ගිණුම් ගත කෙරේ.

(3.2) වත්කම් මිළදී ගැනීම සඳහා රජයේ ප්‍රදානයන් වත්කම්වල ඵලදායි ජීව කාලය ලෙස හඳුනා ගනු ලැබේ.

(4) වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සඳහා වැඩිහිටි පනත
2011 අංක 5 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් සංශෝධිත 2000 අංක 9 දරන පනත අනුව

(5) වගකීම් හා වෙන් කිරීම්
ආයතනයේ සියලු නිලධාරීන් සඳහා සම්පූර්ණ පාරිතෝෂික දීමනා වෙන් කිරීම සිදුකර ඇත .

(6) FIFO ක්‍රමවේදය තොග භාණ්ඩ තහවුරුව සඳහා භාවිතා කරනු ලැබේ

(7) ස්ථාවර වත්කම් ක්ෂය කිරීම්.

(7.1) ක්ෂය ප්‍රතිපත්ති
මිළදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන් ක්ෂය ගණනය කරනු ලබන අතර අවසන් කරන වර්ෂයට ක්ෂය ගණනය කරනු නොලැබේ.

(7.2) පහත පරිදි සරළ මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කර ඇත.

| | | |
|---|---|---|
| ඉදිකිරීම් | - | 04% |
| වාහන සඳහා | - | 10% |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ සඳහා | - | 15% |
| යන්ත්‍රෝපකරණ හා සවිකිරීම සඳහා | - | 20% |

(7.3) ස්ථාවර වත්කම් යටතේ පෙන්වන ලද (ලී බඩු හා කාර්යාලීය උපකරණ) වත්කම්වලින් කොටසක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවතී

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව

| විස්තරය | සටහන | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | | | |
| අතැති මුදල් | 1 | 100,943,749 | 42,799,797 |
| ස්ථාවර තැන්පතු | 2 | 849,424,967 | 395,974,959 |
| සේවක ණය | 3 | 4,122,360 | 4,059,118 |
| නොපිය වූ උත්සව අත්තිකාරම් | 4 | 372,636 | 7,500 |
| වෙනත් ලැබීම් | 5 | 24,956,482 | 754,041 |
| පරිලේඛන/බඩු තොග | 6 | 845,638 | 533,709 |
| | | 980,665,831 | 444,129,125 |
| ස්ථාවර නොවන වත්කම් | | | |
| **ස්ථාවර වත්කම් පිටුව 06** | | | |
| වාහන | | 9,331,500 | 11,486,000 |
| යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | | 8,339,330 | 12,273,593 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | | 9,145,484 | 11,232,078 |
| ඉදිකිරීම් | | 40,840,718 | 7,338,953 |
| ඉඩම් | | 34,200,000 | 13,000,000 |
| | | **101,857,031** | **55,330,624** |
| **මුළු වත්කම්** | | **1,082,522,863** | **499,459,749** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 7 | 2,304,116 | 311,034 |
| පොදු තැන්පත් | 8 | 1,807,092 | 1,866,920 |
| විගණන ගාස්තු වෙන්කිරීම් | 9 | 709,490 | 80,000 |
| පාරිතෝසිත වෙන්කිරීම් | 10 | 14,587,988 | 12,446,287 |
| පසුගිය වසරේ අධිභාර | | 836,871 | - |
| රාජ්‍ය ආයතන සදහා ගෙවීම | | | 293,600 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය අරමුදල | 11 | 910,588 | 737,992 |
| වැඩිහිටි ආරක්ෂණ අරමුදල | 12 | 951,629,668 | 427,704,100 |
| වැඩිහිටි ආවරණ කැපකරු අරමුදල | 13 | 139,188 | 214,188 |
| **සමස්ත ජංගම වගකීම්** | | **972,925,000** | **443,654,121** |
| **මුළු වත්කම්** | | **109,597,862** | **55,805,628** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | |
| රජයේ ප්‍රදානයන් - (මූලධන) | 14 | 55,635,986 | 54,816,763 |
| ප්‍රාග්ධන ප්‍රදාන | 15 | 66,564,480 | 13,000,000 |
| සමුච්චිත අතිරික්තය/හිගය | 16 | (12,602,603) | (12,011,135) |
| **මුළු ශුද්ධ වත්කම/ස්කන්ධය** | | **109,597,862** | **55,805,628** |

අත්සන් කළේ,
ශිරාණි වීරකෝන්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුචින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
# 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# ආදායම් සහ වියදම් වාර්තාව

| විස්තරය | සටහන | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| වෙනත් ආදායම් | 17 | 2,220,526 | 4,667,918 |
| රාජ්‍ය ප්‍රදාන | 18 | 116,226,114 | 126,925,495 |
| ක්‍රමක්ෂය | 19 | 9,405,245 | 9,630,952 |
| **මුළු ආදායම්** | | **127,851,885** | **141,224,365** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල පඩි නඩි | 20 | 69,983,275 | 66,025,932 |
| ගමන් වියදම් | 21 | 1,514,765 | 1,759,166 |
| සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 22 | 1,604,772 | 2,667,439 |
| නඩත්තු වියදම් | 23 | 3,176,375 | 1,770,886 |
| ගිවිසුම්ගත සේවා | 24 | 3,864,682 | 3,292,911 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 25 | 37,587,834 | 55,260,549 |
| ක්ෂය ප්‍රමාණය | 26 | 10,711,649 | 9,630,952 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **128,443,353** | **140,407,835** |
| **අදාල කාලය සඳහා වූ ශුද්ධ ඌණතාවය** | | **(591,468)** | **816,530** |

අත්සන් කළේ,
ශිරාණි වීරකෝන්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු තුළින් වූ අරමුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාවලි අතිරික්තය/ඌණතාවය | (591,468) | 816,530 |
| **මූල්‍යමය නොවන කාර්යයන්** | | |
| ක්ෂය වීම් | 10,711,649 | 9,630,952 |
| ක්‍රමක්ෂය | (9,405,245) | (9,630,952) |
| **ජංගම වත්කම්** | | |
| තොග වැඩිවීම | (311,929) | 174,376 |
| සේවක ණය ඉතිරියේ වැඩිවීම | (63,242) | (106,561) |
| නොපියවූ සේවක අත්තිකාරම් වැඩිවීම | (365,136) | (1,250) |
| ආයෝජනවල වැඩිවීම (ස්ථාවර තැන්පත්) | (453,450,008) | (389,000,000) |
| ලැබිය යුතු ආදායම් | | 881,000 |
| වෙනත් ලැබිය යුතු ආදායම් | (24,202,441) | (754,041) |
| **ජංගම වගකීම්** | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 2,141,701 | 1,726,072 |
| විගණන ගාස්තු වෙන්කිරීම් | 629,490 | |
| සේවක ණය අරමුදල වැඩිවීම | 172,596 | 165,970 |
| පොදු තැන්පත්වල අඩුවීම | (59,829) | (2,153,288) |
| උපචිත වියදම් | 1,993,082 | 124,714 |
| පසුගිය වසරට අදාළ ගැලපුම් | 836,871 | 1,089,719 |
| **මෙහෙයුම් කටයුතු තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(471,963,907)** | **(387,036,760)** |
| **ආයෝජන කටයුතු තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (2,325,056) | (22,855,597) |
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (2,325,056) | (22,855,597) |
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| රජයේ ප්‍රදාන - (මූලධන) | 8,875,947 | 19,785,941 |
| වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමය | (75,000) | (110,000) |
| රාජ්‍ය ආයතනවලට ගෙවීම | (293,600) | 293,600 |
| වැඩිහිටි ආරක්ෂණ අරමුදල | 523,925,568 | 427,704,100 |
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **532,432,915** | **447,673,641** |
| මුදල් හා මූල්‍යමය ප්‍රභවයන්ගේ ශුද්ධ ඉහලයාම | 58,143,951 | 37,781,284 |
| කාලපරිච්ඡේදය අවසානයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | 42,799,797 | 5,018,513 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | 100,943,749 | 42,799,797 |

අත්සන් කළේ,
ශිරාණි වීරකෝන්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුචින්ද්‍ර එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# උප ලේඛන

| 2016 | සටහන් 15 | ප්‍රාග්ධන ප්‍රදාන | 31/12/2017 රු. |
|---|---|---|---|
| 13,000,000.00 | | ඉඩම-හෝලි ක්‍රොස් ගම්පහ | 13,000,000.00 |
| - | | ඉඩම- කතරගම | 18,000,000.00 |
| - | | කතරගම -ඉදිකිරීම් | 33,713,000.00 |
| - | | ඉඩම - හාරගම | 3,200,000.00 |
| | | අඩු කළා විලම්බිත ආදායම | (1,348,520.00) |
| **13,000,000.00** | | **එකතුව** | **66,564,480.00** |

| 2016 | සටහන් 16 | ස්ථාවර තැන්පතු | 31/12/2017 රු. |
|---|---|---|---|
| (13,917,384.62) | | ආරම්භක ශේෂය | (12,011,135.24) |
| 1,089,718.92 | | පෙර වර්ෂයට ගැලපුම | - |
| 816,530.46 | | අතිරික්ත ඌනතාවය/අතිරික්තය | (591,467.99) |
| **(12,011,135.24)** | | **එකතුව** | **(12,602,603.23)** |

| 2016 | සටහන් 17 | වෙනත් ලැබීම් | 31/12/2017 රු. |
|---|---|---|---|
| 378,643.00 | | වෙනත් ආදායම් | 390,511.68 |
| 441,264.07 | | ස්ථාවර තැන්පත් පොලිය | 666,707.00 |
| 580,691..35 | | කොඩි විකුණුම් ආදායම් ලැබීම් | 1,161,986.23 |
| | | **එකතුව** | |

| 2016 | සටහන් 20 | පුද්ගලික පඩි නඩි | 31/12/2017 රු. |
|---|---|---|---|
| 28,211,621.43 | | වැටුප් හා වේතන | 35,985,752.10 |
| 4,355,437.60 | | සේවක අර්ථසාදක අරමුදල | 5,408,393.64 |
| 1,081,900.98 | | සේවක භාරකාර අරමුදල | 1,351,764.14 |
| 497,351..36 | | අතිකාල | 419,510.39 |
| 125,181..05 | | නිවාඩු දින වැටුප් | 112,118.71 |
| 11,468,517.07 | | ජීවන වියදම් දීමනා | 12,009,675.45 |
| 18,292,492.19 | | අන්තර් දීමනා | 11,999,938.78 |
| 1,993,430.00 | | පාරිතෝෂික | 2,696,122.00 |
| **66,025,931.68** | | **එකතුව** | **69,983,275.21** |

| 2016 | සටහන් 21 | ගමන් වියදම් | 31/12/2017 රු. |
|---|---|---|---|
| 1,360,811.10 | | දේශීය | 1,168,989.00 |
| 398,354.72 | | විදේශීය | 345,775.55 |
| **1,759,165.82** | | **එකතුව** | **1,514,764.55** |

| 2016 | සටහන්22 | සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 31/12/2017රු. |
|---|---|---|---|
| 1,704,044.23 | | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 995,394.91 |
| 939,394.80 | | ඉන්ධන හා ලිහිසි තෙල් | 597,377.05 |
| 24,000.00 | | නිල ඇඳුම් | 12,000.00 |
| **2,667,439.03** | | **එකතුව** | **1,604,771,96** |

| 2016 | සටහන් 23 | නඩත්තු වියදම් | 31/12/2017 රු. |
|---|---|---|---|
| 1,350,777.35 | | වාහන | 2,456,555.45 |
| 420,108,56 | | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 719,819.90 |
| **1,770,885.91** | | **එකතුව** | **3,176,375.35** |

| 2016 | සටහන් 24 | ගිවිසුම් සේවා | 31/12/2017 රු. |
|---|---|---|---|
| 183,727.79 | | තැපැල් හා විදුලි සංදේශ සේවා | 655,547.00 |
| 852,379.81 | | විදුලිය හා ජලය | 1,791,732.24 |
| 1,630,725.31 | | පිරිසිදු කිරීමේ ගාස්තු | 278,814.12 |
| 272,313.68 | | වෙනත් - පුවත්පත් | 34,713.50 |
| 32,358.00 | | වෙනත් - සංග්‍රහ වියදම් | 76,180.50 |
| 69,628.00 | | අනෙකුත් දීමනා | 148,999.00 |
| 21,949.00 | | ප්‍රවාහන | 240,191.00 |
| 221,329.50 | | බැංකු ගාස්තු | 9,015.00 |
| 8,500.00 | | විගණන ගාස්තු | 629,490.00 |
| **3,817,027.91** | | **එකතුව** | **3,864,682.36** |

| 2016 | සටහන් 25 | වෙනත් මෙහෙයුම් වියදම් | 31/12/2017 රු. |
|---|---|---|---|
| 1,998,600.00 | | ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම | 1,498,327.50 |
| 601,553.15 | | හැඳුනුම්පත් නිකුත් කිරීම | 483,745.86 |
| 3,995,431.00 | | දිවා මධ්‍යස්ථාන පිහිටුවීම හා ස්වයං රැකියා ආධාර ලබා දීම | - |
| 1,640,058.50 | | ප්‍රකාශන | 1,695,204.00 |
| 5,496,372.14 | | පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 3,924,349.11 |
| 9,998,415.00 | | වෛද්‍ය සායන පැවැත්වීම, අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම | 703,410.00 |
| 10,881,796.35 | | ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම | 15,966,800.50 |
| 13,607,794.09 | | වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදීම | 2,373,081.82 |
| 1,049,580.00 | | ජාතික සහා සාමාජික දීමනා | 1,003,095.20 |
| 892,097.00 | | නඩත්තු මණ්ඩලය සඳහා දීමනා | 1,048,903.00 |
| 2,923,057.24 | | 2000/-දීමනාවේ පරිපාලනමය වියදම් | 5,066,864.48 |
| 250,000.00 | | පිළිකා රෝගීන් සඳහා ආධාර | - |
| 1,925,795.02 | | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 3,824,052.90 |
| **66,657,324.83** | | **එකතුව** | **37,587,834.37** |

| 2016 | සටහන් 26 | ක්ෂය ප්‍රමාණය | 31/12/2017 රු. |
|---|---|---|---|
| 3,064,472.88 | | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2,928,169.34 |
| 2,154,500.00 | | වාහන | 2,154,500.00 |
| 4,106,188.92 | | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 4,114,295.42 |
| 305,789.71 | | ඉදිකිරීම් | 1,514,684.03 |
| **9,630,951..51** | | **එකතුව** | **10,711,648.79** |

# විගණකාධිපතිගේ මතය

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2017දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්ථාවක් සභාවේ සභාපතිවරයා වෙත 2018 ජුලි 26 දින නිකුත් කරනු ලැබේ

# තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/ සී/එන්සීඊ /1 /17/19

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 අගෝස්තු 31 දින

සභාපති

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2018 ජුලි 26 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department
AGDSL

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.9,470,084 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාලයට අයත් මල්වතු හිරිපිටිය පිහිටි ඉඩම රු.4,200,000 ක් සහ එම ඉඩම තුළ පිහිටි ගොඩනැගිල්ල රු.16,122,000 කට තක්සේරු කර තිබුණද ඒවා ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂ දෙක තුලදී වැඩිහිටි නිවාස තුනකට පරිත්‍යාග වශයෙන් මිලදී ගත් රු.369,928 ක් වටිනා ලීබඩු උපකරණ එම ආයතනවලට ලබාදී ඇතත් ආයතනයේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර ඒ සඳහා රු.138,240 ක ක්ෂයවීම් ද ගැලපුම් කර තිබීම හේතුවෙන් වත්කම් සහ ක්ෂයවීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

4

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය කාර්යාලවලින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ සමාජ ආරක්ෂණ අරමුදල වෙත ලැබිය යුතු රු.18,814,700 ක් හා කොඩි විකිණීමෙන් එම කාර්යාල වෙතින් ලැබිය යුතු රු.335,792 ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බෙදා නොහැර ඉතිරි වූ වැඩිහිටි සංවිධාන සඳහා අතුරු ව්‍යවස්ථාවේ ඉතිරි පිටපත් 25,466 ක පිරිවැය රු.763,980 ක් ලිපි ද්‍රව්‍ය තොගයට ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර හා උපකරණ ක්ෂය වටිනාකම රු 3,808,742 ක් වුවද එම අගය රු.4,114,295 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය වටිනාකම රු.305,553 කින් වැඩියෙන් දැක්වුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි. |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | වැඩිහිටි දිනය වෙනුවෙන් උපහාර පිදීම් සඳහා චෙක්පත් ලබාදීම | 2,625,000 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 48 ක් වෙත වැඩිහිටියන් 105 දෙනෙකු සඳහා ලබාදීමට යවන ලද චෙක්පත් ලද බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සනාථ කිරීම් |
| (ආ) | වැඩිහිටි දීමනා ගෙවීම | 1,780,000 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක් වෙත යවන ලද මුදල් ලබාගත් බවට දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සනාථ කිරීම් |

5

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

**2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වු නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.3(අ) ඡේදය | සියළුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කලයුතු නමුත් සභාව විසින් ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(5) හා 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | තත්කාර්ය අතුරු අග්‍රිම දෙන ලද කාර්යය නිමකල විගස පියවිය යුතු වුවත් අවස්ථා 18 කට අදාළව ලබාදී තිබුණු එකතුව රු.455,300 ක් වූ අත්තිකාරම් අදාල කාර්යය නිමවී දින 12 සිට දින 131 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාදවී පියවීම් සිදුකර තිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ආයතනයට අයත් සියළුම පරිගණක උපාංග සහ මෘදුකාංග ස්ථාවර වත්කම් ලේඛනයක දැක්විය යුතු වුවත්, ලේකම් කාර්යාලයට අයත් රු.10,482,420 ක් වටිනා පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වාර්ෂික වාර්තාවේ කෙටුම්පත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2015 මැයි 15 දිනැති අංක මු.අ.01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3 (අ) සහ 4(ඇ) ඡේද | විදේශ පුහුණු, සම්මන්ත්‍රණ, රැස්වීම් සහ වැඩමුළු සඳහා සහභාගීවීමේදී අනියම් දීමනාව වශයෙන් නිලධාරියෙක් සඳහා ලබාදිය හැකි වනුයේ දිනකට ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 40 ක් වුවද |

නිලධාරීන් 02 දෙනෙකු සඳහා දිනකට ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 75 ක් ලබා දී තිබුණි. ඒ අනුව රු.98,492 ක් වැඩියෙන් මුදල් ගෙවා තිබුනු අතර එම මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.591,468 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 816,530 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,407,998 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ වියදම රු.11,964,482 කින් අඩුවුවද ආදායම රු.13,372,480 කින් අඩුවීම නිසා මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌනතාවයක් පැවතියද 2016 වර්ෂයේ මූල්‍ය අතිරික්තයක් ඇතිවී 2017 වර්ෂයේදී නැවත ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.16,523,248 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනයවී 2017 වර්ෂයේ දී රු.46,105,933 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ කටයුතු කෙටිකාලීන සහ දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කිරීමට අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක කරා ළඟාවීමට හැකිවන පරිදි ආයතනය මෙහෙයවීම සභාවේ පූර්ණ වගකීම වුවද සභාව විසින් සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැළැස්ම ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සභාව විසින් හඳුන්වා දී නොතිබුණි. එමෙන්ම වර්ෂ කිහිපයක සිට එකම ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර තිබූ අතර පනතේ කර්තව්‍යයන්ට සුදුසු ආකාරයට සකස් කර නොතිබුණි.

**4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**

**(අ) අක්ෂි කාච සහ ශ්‍රවණ උපකරණ ලබාදීම**

සමාලෝචිත වර්ෂය සඳහා වැඩිහිටියන් වෙත වෛද්‍ය උපකරණ වශයෙන් අක්ෂිකාච 3,530 ක්, ශ්‍රවණ උපකරණ 400 ක් සහ වෛද්‍ය කඳවුරු 10 ක් පැවැත්වීම වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම මගින් රු.10,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අක්ෂිකාච මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේ පුවත්පත් දැන්වීමක් පලකර තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණේ ඔක්තෝබර් 31 දිනදීය. ඒ අනුව දෙසැම්බර් 15 දින ලංසු විවෘත කර එකක් රු.5,500 බැගින් රු.5,775,000 ක අක්ෂිකාච 1,050 ක් මිලදී ගැනීමට පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක අංක 31 ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සති 04 කින් අවසන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වන තෙක් අදාල මිළදී ගැනීම් සිදුකර නොතිබුණි.

(ii) සභාව විසින් ශ්‍රවණ උපකරණ 400 ක් මිළදී ගෙන බෙදාහැරීමට සැළසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ඒ සම්බන්ධව කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

(iii) වෛද්‍ය කඳවුරු පැවැත්වීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 09 ක් විසින් ඉල්ලුම් කරන ලද රු.776,050 ක් ලබාදී තිබුණද දිස්ත්‍රික්ක වෙත ලබාදිය යුතු ප්‍රතිපාදනය කොපමණද යන්න පිළිබඳව සැළසුම්කර නොතිබුණි. එසේම මෙම වෛද්‍ය සායන සඳහා මුදල් සමාලෝචිත වර්ෂයේ අවසාන මාස 02 තුලදී ලබාදී තිබූ අතර එම වෛද්‍ය සායන පැවැත්වූ බවට අදාල වියදම් විස්තර හෝ ලබාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද එම වර්ෂය තුළදී වෛද්‍ය සායන පැවැත්වූයේ ද යන්න විගණනයට සනාථ නොවීය. මේ අනුව අදාළ වර්ෂයට කරන ලද සැළසුම් එම වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වී නොතිබීම නිසා සියයට 92 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

8

(ආ) පුහුණු පර්යේෂණ සහ දැනුවත්කිරීම් වැඩසටහන්

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පුහුණු සහ දැනුවත්කිරීමේ වැඩසටහන් 12 ක් සඳහා රු.8,575,000 ක් හා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් 04 ක් සඳහා රු.4,000,000 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර එම වැඩසටහන් සඳහා පිළිවෙලින් රු.3,949,136 ක් සහ රු.3,824,052 ක් වැයකර තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් 04 යටතේ නායකත්ව පුහුණු වැඩ සටහන් 02 ක් පැවැත්වීමට සැලසුම් කළද පවත්වා තිබුනේ එක් වැඩසටහනක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම් කළ පුහුණු හා ධාරිතා වැඩසටහන් නොපැවැත්වීම හේතුවෙන් එම වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදනය කරන ලද රු.1,071,000ක මුදල් ඉදිරි වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පැවැත්වෙන වෘද්ධ විද්‍යාව ඩිප්ලොමාව සඳහා යොදවා තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපාදනයන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ඉදිරි වර්ෂය සඳහා යොදවා ගෙන තිබුණද, මෙම පාඨමාලාව සඳහා කාර්යාල නිළධාරින් 21 දෙනා සහභාගි කර නොතිබුණි.

(ඇ) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීම

වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යාවත්කාලීන කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම සභාවේ පනතේ කර්තව්‍යයන් වලින් එක් කාර්යයක් වූ අතර ඒ සඳහා නිවැරදි දත්ත පද්ධතියක් පවත්වාගෙන යායුතු බව පොදු ව්‍යාපාර කාරක සභාව විසින් නිර්දේශ කර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ වැඩිහිටි දිනය වූ ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද අන්තර්ජාලය මගින් ලංකාවේ දිස්ත්‍රික්ක 25 ක වැඩිහිටි නිවාස, වැඩිහිටි කමිටු, වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ වැඩිහිටි සංඛ්‍යාව ඇතුළත් කිරීමට සැළසුම් කර මෙම දත්ත අන්තර්ජාලයට ඇතුළත් කිරීමට වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ද දැනුවත් කර තිබුණි. කෙසේ වුවද, දත්ත පද්ධතිය යාවත්කාලීනවී නොතිබුණි.

9

විගණකාධිපති දෙපාර්තමේන්තුව
தணிக்கையாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඇ) වැඩිහිටි දිනය පැවැත්වීම

සමාලෝචිත වර්ෂයේ ජාත්‍යන්තර වැඩිහිටි දිනය ඔක්තෝබර් 01 දිනට යෙදී තිබුණු අතර එම දිනය සැමරීම සඳහා ක්‍රියාකාරී සැලස්ම යටතේ රු.16,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි. ඒ වෙනුවෙන් කර්තව්‍යයන් 08 ක් ඇතුළත්ව රු.18,758,000 ක ඇස්තමේන්තුවක් සකස්කර තිබූ අතර රු.15,966,800 ක් වියදම් දරා තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 122 ක වයස අවුරුදු 100 ඉක්මවූ වැඩිහිටියන් 213 දෙනෙකුට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 65 ක වයස අවුරුදු 75 ඉක්මවූ වැඩිම දරුවන් සිටින වැඩිහිටි මාතාවන් 78 දෙනෙකුට රු.25,000 බැගින් රු.7,275,000 ක මුදල් ප්‍රදාන ලබාදීමට කටයුතු කර තිබුණි. එසේවුවද 2017 නොවැම්බර් 23 සහ 24 දෙදින දෙක තුළ රු.7,100,000 ක් වටිනාකමැති චෙක්පත් 184 ක් ලියා අත්සන් කර දින 45 ක පමණ කාලයක් ප්‍රමාදවී එනම් 2018 ජනවාරි 16 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඍජුව තැපැල් කර තිබුණි.

(ii) 2018 පෙබරවාරි අවසාන සතිය වන විට මෙම මුදල් වැඩිහිටියන් වෙත ලැබී තිබුණද, මුදල් ලැබුණු බවට තහවුරු කිරීම් ලබා ගෙන නොතිබුණි.

(iii) වයස අවුරුදු 100 ඉක්මවූ වැඩිහිටියන් සඳහා උපහාර පිදීමත් වයස අවුරුදු 75 ඉක්මවූ වැඩිම දරුවන් සිටින මවුවරුන්ට උපහාර පිදීමත් යන කරුණු 02 මෙම වැඩිහිටි දිනයේ ප්‍රධාන කර්තව්‍යය වූ බැවින් වැඩිහිටි දිනයේදීම එම උපහාර පිදීමට හැකියාව තිබියදීත් එම දිනය අවසන්වී මාස 04 කට පමණ පසුව ත්‍යාග ලබාදී තිබුණි. එම මුදල් ලැබෙන අවස්ථාව වන විට වැඩිහිටියන් බොහෝදෙනෙකු මියගොස් තිබූ බව අනාවරණය විය. වැඩිහිටි සමාජයට ඉටුවිය යුතු එක් අරමුණක් ඉටුකිරීමට මෙවැනි ප්‍රමාදයක් පැවතීම කළමනාකරණයේ දුර්වලතාවයක් බව විගණනය පෙන්වාදෙනු ලැබේ.

(ඉ) වැඩිහිටි දිනය වෙනුවෙන් කොඩි සහ ස්ටිකර් අලෙවිය

වැඩිහිටි දිනය වෙනුවෙන් කොඩි සතියක් ආරම්භ කර රු.979,558 ක් වැයකර කොඩි 2,310,000 ක් සහ ස්ටිකර් 33,100 ක් මුද්‍රණය කර තිබුණි. එම කොඩි සහ ස්ටිකර් බෙදාහැරීම සඳහා රු.115,615 ක් වැය කර දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 කට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 317 කට කොඩි 2,302,400 ක් සහ දිස්ත්‍රික් ලේකම්

කාර්යාල 20 කට ස්ටිකර් 28,200 ක් බෙදාදී තිබුණි. එක් කොඩියක් රු.10 ක් සහ ස්ටිකර් එකක් රු.100 ක් ලෙස මිළ කර තිබුණු අතර කොඩි හා ස්ටිකර් වල මුහුණත් වටිනාකම රු.26,410,000 ක් විය.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දිස්ත්‍රික්ක 25 කට ලබාදුන් කොඩි 2,302,400 කින් කොඩි 1,856,322 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 317 කට බෙදාදී තිබුණි. ඒ අනුව ඉතිරි කොඩි 446,078 ක් සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) කොඩි සහ ස්ටිකර් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට 35 ක් හෙවත් රු.11,658,500 ක් ආයතනයට ලැබිය යුතු අතර ආයතනයට ලැබී තිබුණේ රු.826,194 කි. එසේම සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 230 ක කොඩි 1,653,460 ක් හෙවත් සියයට 71 ක ඉතිරියක් පැවති අතර අලෙවි නොකරන ලද කොඩි 75,422 ක් විනාශ කර තිබුණි. එසේ ඉතිරිවූ කොඩි සහ විනාශ කරන ලද කොඩි 1,728,882 ක මුද්‍රණ පිරිවැය රු.587,799 ක් වූ අතර එය ආයතනයට පාඩුවක් විය. මේ අනුව කොඩි මුද්‍රණය හා බෙදාහැරීම සහ කොඩි අලෙවිකිරීම හා අලෙවි ආදායම් රැස්කර ගැනීමට ආයතනය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

(iii) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 20 ක් සඳහා ස්ටිකර් 28,200 ක් බෙදාහැර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 13 කින් ස්ටිකර් 2,490 ක් අලෙවි වූ බව නිරීක්ෂණය විය.ඒ අනුව ස්ටිකර් 25,710 ක් අලෙවිකළ බවට තොරතුරු ඉදිරිපත් නොවූ අතර එම ස්ටිකර්වල මුද්‍රණ පිරිවැය රු.159,753 ක් විය.

**(ඊ) වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වා ගැනීම**

---------------------------------------------------

2017 ජනවාරි මාසයේදී වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම ආරම්භ කර තිබුණු නමුත් එය අවසන් කර නොතිබුණි. එසේම වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 150 ක් හඳුනා ගෙන තිබුණද වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් ආධාර මුදල් ලබාදී නොතිබුණි.

11

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department
AGDSL

(උ) වැඩිහිටි නිවාස සුපරීක්ෂණය

-----------------------------

ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන මුළු වැඩිහිටි නිවාස සංඛ්‍යාව 306 ක්වූ අතර කාර්යාලයේ ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව 119 ක් වී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ මෙම වැඩිහිටි නිවාස වලින් 19 ක් පමණක් කාර්යාලය විසින් පරීක්ෂාවට ලක්කර තිබුණි.

(ඌ)පනතේ අරමුණු ඉටු නොකිරීම

--------------------------------

2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වගන්තිය ප්‍රකාර වැඩිහිටි තැනැත්තන් සඳහා ජාතික සභාව විසින් පහත සඳහන් කර්තව්‍යයන් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යෑම

(ii) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළුවලට බලපාන ප්‍රධාන හේතු සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා අභිලාෂයන් හඳුනා ගැනීමේ අදහසින් අධ්‍යයනයන් හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ඒ හේතු මර්දනය කිරීම හෝ මුලිනුපුටා දැමීම සඳහා සහ ඔවුන්ගේ ඒ අවශ්‍යතා හා අභිලාශ ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම,

(iii) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළු අවශ්‍යතාවයන් හා අභිලාෂයන් පිළිබඳව මහජනයා දැනුවත් කිරීම

(iv) වැඩිහිටි තැනැත්තන්ගේ තත්ත්වය නඟාලීම සඳහා රජය විසින් සහ ස්වේච්ඡා සංවිධාන හා පුද්ගල මණ්ඩල විසින් ආරම්භ කරන ලද හා ක්‍රියාවේ යොදවනු ලබන වැඩසටහන් හා යෝජනා ක්‍රම සමීක්ෂණය කිරීම හා සම්බන්ධිකරණය කිරීම

(v) වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හා ක්‍රියාවේ යෙදවීම.

12

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

(vi) වැඩිහිටි තැනැත්තන්ගේ දැන ගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා ඇති වැටුප් ගෙවන හා වැටුප් නොගෙවන රැකියා අවස්ථා පිළිබඳ නාමාවලියක් පවත්වා ගෙන යාම හා හැකි සෑම අවස්ථාවකම ඔවුන්ට ආදායමක් ලැබෙන සේවා නියුක්තියක නිරත වීම සඳහා උපකාර කිරීම සහ මහජනතාවගේ දැනගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ සහජ හැකියාවන් සහ දක්ෂතා ඇතුලත් කොට ඔවුන් පිළිබඳ නාමාවලියක් පවත්වාගෙන යෑම.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වයස අවුරුදු 75 දක්වාවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකිරීම සහ අවුරුදු 65 ට වැඩි වැඩිහිටියන් වෙනුවෙන් පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් වැඩිහිටි තැනැත්තන් සඳහාවූ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ඉකුත් වර්ෂයේදී ලැබුණු රු.5,000,000 කින් වැඩිහිටි මහ ලේකම් කාර්යාලය සහ ප්‍රදේශීය ලේකම් කාර්යාල 331 ක දැනුවත් කිරීම් වැඩසටහන් සඳහා එම වර්ෂයේදී රු.3,305,836 ක් වැය කර තිබුණි. ඉන් ඉතිරිය වූ රු. 1,694,164 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. කෙසේ වුවද විගණිත දිනය වූ 2018 ජූනි 30 දිනවන විට වර්ෂ 02 ක් ගතවී ඇතත් ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කර නොතිබුණි.

(ආ) ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයට වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථානයක් පවත්වා ගැනීම සඳහා 2009 වර්ෂයේදී තෑගි ඔප්පුවකින් ලැබුණු අක්කර 02 ක් වූ නිවිතිගල නිල්වලා සෙවන ආබාධිත මධ්‍යස්ථානයේ ඉඩම සහ ගොඩනැගිල්ල ඇස්තමේන්තු කර පවරා ගැනීම සිදුකර ගෙන නොතිබුණි. එසේම එම වර්ෂයේදීම රු.390,000 ක අළුත්වැඩියාවක් ද එම ගොඩනැගිල්ලේ සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂය දක්වාම කිසිදු කාර්යයක් සඳහා යොදා නොගෙන වසා දමා තිබීමේ හේතුවෙන් අදාල පාර්ශවකරුවන්ද මෙම ඉඩම නැවත ඉල්ලා නඩු පවරා තිබුණි.

(ඇ) ආයතනය විසින් 2003 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මිළදීගත් වටිනාකම රු.26,715,433 ක් වූ ලිබඩු, කාර්යාල උපකරණ සහ යන්ත්‍රෝපකරණ එක් එක් වර්ෂයේදී වත්කම් වර්ගීකරණය සිදුනොකර වර්ෂය තුළ මිළදීගත් මුළු වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබීමෙන් අපහරණයන් සහ ප්‍රයෝජනයට නොගන්නා වත්කම් හඳුනා ගැනීමට නොහැකිවී තිබුණි.

13



(ඇ) සමාලෝචිත වර්ෂයේදී කාර්යාලයේ සේවයෙන් විශ්‍රාම ගත් නිලධාරින් 06 දෙනෙකු සඳහා පාරිතෝෂික රු.104,445 ක් වැඩියෙන් ගෙවා තිබුණු අතර වාර්තාවේ දින වනවිටත් එම මුදල් අයවී නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා මාසිකව ලබා දෙන රු.2,000 ක වැඩිහිටි දීමනාවෙන් නැවත රු.100 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැඩිහිටි මහ ලේකම් කාර්යාලය වෙත ලබා දෙන අතර එම මුදලින් කළයුතු කාර්යයන් 10 ක් සඳහා ඉකුත් වර්ෂයේ අගෝස්තු 30 දිනැති අංක අමප/16/0719/711/010 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අනුමැතියද ලබාගෙන තිබුණි. ඉකුත් වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.860,094,400 ක මුදලක් ලැබී තිබුණු අතර අදාල කාර්යයන් ඉටුකිරීමකින් තොරව ලැබුණු මුදලින් රු.841,783,300 ක් රාජ්‍ය බැංකු 02 ක කෙටිකාලීන ස්ථාවර තැන්පතු ගිණුම්වල තැන්පත් කර තිබුණි.

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වැඩිහිටි දීමනාවෙන් අය කරනු ලබන රු.100 ක මුදල චෙක්පත් මගින් එවන අතර එහිදී දෝෂ සහිත චෙක්පත් ආයතනය විසින් නැවත එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 54 කින් රු.19,738,200 ක් අයවිය යුතුව පැවතුණු අතර එම මුදල් අයකර ගැනීමට විධිමත් පියවරගෙන නොතිබුණි.

(ආ) ආයතනය විසින් ස්ථාවර තැන්පතු කල්පිරීමේදී ප්‍රති ආයෝජනය කරන අතර එසේ කල්පිරුණු රු.577,394,762 ක් වටිනාකමැති ස්ථාවර තැන්පතු ප්‍රති ආයෝජනය තෙක් දින 07 සිට දින 47 ක කාලයක් නිශ්කාර්යව පැවතීම හේතුවෙන් රු.2,675,830 ක පොළියක් අහිමිවී තිබුණි.

14

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department
AGDSL

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සාමාජිකයකු තම පෞද්ගලික විදේශ ගමනක් වෙනුවෙන් වැයකර තිබුණු රු.59,800 ක් වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

වැඩිහිටි නිවාස ඉදිකිරීම සඳහා ආයතනය වෙත 2011 වර්ෂයේදී බාහිර පාර්ශවයකගෙන් තෑගි ඔප්පුවක් මගින් වටිනාකම රු.13,000,000 ක් වූ ගම්පහ හෝලික්‍රොස් ඉඩම සහ රු.3,200,000 ක් වටිනාකමැති හාරගම රාජිත වත්ත ඉඩම ලැබී තිබුණද නිවාස ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට අපොහොසත් වීම හේතුවෙන් එම ඉඩම් නිෂ්කාර්යව පැවතිණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 143 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 133 ක් විය. ඒ අනුව පුරප්පාඩු 10 ක් පැවතිණි. 2011 වර්ෂයේ සිටම පුරප්පාඩුවී පැවති සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර සහ නීති නිලධාරී තනතුර 2018 මැයි 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ආ) සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරියකු බඳවා ගැනීමට 2017 ජනවාරි 11 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණද විගණිත දිනය වූ 2018 මැයි 18 වනවිටත් ඒ සඳහා නිලධාරියකු බඳවාගෙන නොතිබුණි.

(ඇ) නුවරඑළිය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිසිවක් සඳහා වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් පත්කර නොතිබුණු අතර රත්නපුර සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර තිබුනේ අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාවට වඩා අඩු සංඛ්‍යාවකි.

15

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

## 5. තිරසර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත්වී නොතිබුණි. එසේ දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

2009 ජූනි 09 දිනැති අංක DMA /2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 09 වන ඡේදය පරිදි කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කළ යුතුවූවත් එම වාර්තා පිළියෙල කර නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදනය

ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රාග්ධන උපකරණ මිළදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට නොවැම්බර් දක්වා අවස්ථා 06 කදී භාණ්ඩාගාරයෙන් රු.8,875,947 ක් ලබාගෙන තිබුණි. ආයතනය විසින් වර්ෂය තුළදී රු.2,325,055 ක උපකරණ මිළදී ගෙන තිබුණු අතර පරිගණක 63 ක් මිළදී ගැනීමේ කටයුතු දෙසැම්බර් 31 දින දක්වා ප්‍රමාද වීම හේතුවෙන් රු.6,550,892 ක් හෙවත් සියයට 73 ක් උපයෝජනය කිරීමට නොහැකිවී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආයතනයේ අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවන අයුරින් සකස්වී නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

### 6.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 26 සිට සියයට 93 දක්වා පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ජාතික සභාවේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | වත්කම් හා පරිත්‍යාග නිසිපරිදි ගිණුම් ගත නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩලය පරිපාලනය | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම සභාවේ අරමුණු ඉටුකර ගැනීමට බාධාවක් වීම. |
| (ඇ) | අරමුදල් පාලනය | වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල නිෂ්කාර්යව පවත්වා ගැනීම |
| (ඈ) | ඉඩම් සංවර්ධනය | පරිත්‍යාග වශයෙන් ලැබෙන ඉඩම් අරමුණුගත කාර්යයන් සඳහා යොදා නොගැනීම |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය**
**முதியோர்களுக்கான தேசிய செயலகம்**
**National Secretariat for Elders**

සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය
சமூக நலன்புரி மற்றும் ஆரம்ப கைத்தொழில் அமைச்சு
Ministry of Social Welfare and Primary Industries

*සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා - செயலூக்கமான முதுமையை நோக்கி - Towards an Active Ageing*

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | NSE/ACC/02/02 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2018.07. 24 |

ලේකම්,
සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය,
සභාපති,
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව මඟින්,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

<u>වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් විගණකාධිපති විසින් යොමු කරන ලද අංක එල්ඊඩබ්/සී/එන්සීඊ/1/17/19 හා 2018.07.16 මුදල් පනතේ 14(2)(සී) වගන්ති ප්‍රකාරව 2017.12.28 දින වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත. වාර්තාව ඉදිරිපත් කරන ලදි. ඒ අනුව පෙන්වා දී ඇති කරුණු පිළිබඳව යෝජිත ක්‍රියාමාර්ග පහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

විගණකාධිපති වාර්තාවට අනුව ඡේද අංක
<u>2. මූල්‍ය ප්‍රකාශන</u>
2.1 මූල්‍ය ප්‍රතාශන පිලිබඳ අදහස් දැක්වීම
2.1.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

මේ වන විට ඒ සඳහා ප්‍රත්‍යාගණන කමිටුවක් පත් කර ඇති අතර එම පත් කල කමිටුව මඟින් ප්‍රත්‍යාගණන කටයුතු සිදු කිරීමට අදාල මූලික කටයුතු සිදු කරමින් පවතී.

<u>2.2.1. ගිණුම්කරණ අඩුපාඩු</u>
(අ) සහ(ආ)
පාරිතෝෂිත ගණනය සඳහා සම්පූර්ණ නොකරන ලද සේවා කාලයන් ගණනය කිරීමත්, 2014 නොවැම්බර් 17 දිනැති චක්‍රලේඛය පිළිබඳ නිලධාරීන් දැනුවත් නොවී තිබීම හේතුවෙන් මෙම වැඩිපුර ගණනයවීම් ඉදිරියේදී සිදු නොවීමට වග බලා ගන්නා බව දන්වමි.මෙම මුදල් අදාල සේවකයන්ගෙන් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි.

(ඇ) 2018 වර්ෂයේ අවසන් ගිණුම් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන ලදි.

(ඈ) 2015 වර්ෂයේ රු. 418,088/-ක මුදලක් ලී බඩු හා කාර්යාල උපකරණ ගිණුමට ඇතුලත් කර ස්ථාවර වත්කම් ලේඛනයෙහි සටහන් කර ක්ෂය කර ඇති බව විගණනයෙන් පෙන්වා දී ඇති නමුත් එහි ඇතුලත් කර ඇති පරිදි මහනුවර ගොඩහේවා වැඩිහිටි නිවාසයට රු.273,428/-ක උපකරණ ලබා දි ඇති බවත් රු. 96,500/-ක මැදිරිගිරි වැඩිහිටි නිවාසය සඳහා භාණ්ඩ මිලදී ගෙන ඇති බවත් සඳහන් කර ඇත. ඒ අනුව වැඩිහිටි නිවාස සඳහා භාණ්ඩ මිලදී ගැනිම වෙනුවෙන් වියදම් වු රු. 369,928/-ක මුදල ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර නිවරදි කිරීමට කටයුතු කරන ලද අතර ඉතිරි රු. 43,160/-ක මුදලින් කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කරන ලද නිලධාරියා සඳහා කාර්යාලීය උපකරණ මිලදී ගැනිමට ලබා දෙන ලදි. ඒ අනුව එම මුදල ස්ථාවර වත්කම් ලේඛනයේ ලි බඩු හා කාර්යාලීය උපකරණ ගිණුමේ සටහන් කර තැබීම නිවරදිව සිදු කර ඇති බැව් සඳහන් කරමි.

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D, செத்சிறிபாய – கட்டம் II, பத்திரமுல்லை
Address : 2nd Floor,Block D, Sethsiripaya – II Stage, Baththaramulla.
ඊ-මේල් / ஈ-மெயில் / E-mail : nsemss@gmail.com
දුරකතන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 2187045
කාර්යාලය / அலுவலகம் / Office : 0113094543/4
: 0113355485

(ඉ) මෙම ක්‍රියාවලියේ යම්කිසි ගිණුම්කරණ දෝෂයක් වෙතොත්, ඉදිරියේදී ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනසක් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි.

(ඊ) වැඩිහිටි සංවිධාන සඳහා වන අතුරු වයවස්ථාවේ පිටපත් මේ වන විට බෙදා අවසන්ව ඇති අතර ඔබ සඳහන් කරන පරිදි වටිනාකම රු. 763,980/-ක් වූ පොත්වල වටිනාකම වියදමක් සේ සලකා ගිණුම්ගත කර ඇත.

(උ) යන්ත්‍ර හා උපකරණවල ක්ෂය වටිනාකම වූ 4,114,295ක අගය 2017 මූල්‍ය ප්‍රකාශනවල දන්වා ඇති නිවැරදි අගය වේ.

2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් සිදු කල පසුවිපරම් කටයුතුවලින් අනතුරුව මේ වන විට ඊට අදාල තහවුරු කිරීමේ සාක්ෂි බොහෝමයක් ලැබී ඇත.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 වෙත යැවූ පරිපාලන වියදම් රු. 5,000/-ට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 200කින් මේ වන විට ලදුපත් ලැබී ඇති අතර ඉතිරි ලදුපත් ප්‍රමාණයද ගෙන්වා ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඇ) 2015 වර්ෂයේ සිට ස්ථාවරවත්කම් ලේඛනයක් පවත්වා ගැනීම ආරම්භ කර ඇති අතර ඊට පෙර භාවිතා කල සියලුම ස්ථාවර වත්කම් වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු 2018 වර්ෂයේදී ප්‍රත්‍යාගණන කමිටුවක් පත්කර එමගින් සිදු කිරීමට කටයුතු යොදා ඇත.

2.2.3. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) ඉදිකිරීම් කටයුතු වලදී මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කළ යුතු වුවත් මෙම කාර්යයන් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අවශ්‍ය නොවන බව හැඟී ගිය බැවින් සකස් නොකරන ලදී. ඉදිරියේදී සිදු කරන ඉදිකිරීම් කටයුතු වලදී මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 1. සුළු මුදල් අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දිනට පියවා ඇත.
2. අදාල කර්තව්‍ය නිමකිරීමෙන් අනතුරුව දින 07ක් ඇතුලත ගෙවීම් පියවීම් නිර්දේශ කර ගිණුම් අංශයට ඉදිරිපත් කර ඇත.

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ අංක IAU/2002/02 ට අනුව පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යයි.

(ඈ) අදාල චක්‍රලේඛනයේ පිටපතක් මේ සමඟ අමුණා ඇති අතර ඒ අනුව කටයුතු කර ඇත. (ඇමුණුම 01)

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 සැලසුම් කිරීම

වර්ෂ 03ක් පදනම් කර ගනිමින් සංයුක්ත සැලැස්මක් මේ වන විට පිළියෙළ කර නොමැති අතර 2019 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මක් සකස් කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වමි.

ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සටහන් කිරීම හා යාවත්කාලීන කිරීම මේ වන විට සිදු කරමින් පවතී.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ) අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබා දීම

I. 2017 වර්ෂයේ අක්ෂිකාච ලබා දීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු සිදුකර අවසන් වන විට 2017 වර්ෂය අවසන් වී ඇති බැවින් මිලදී ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණු නිසා මෙම උපකරණ මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමියගේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය.එබැවින්, අක්ෂි කාච මිලදී ගැනීමේ කාර්යය සිදු කිරීමට නොහැකි විය.

II. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් වෛද්‍යවරුන් 2ක් ලබාදෙන ලෙස සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගෙන් කරන ලද ඉල්ලීමකට අනුව නම් කර එවන ලද වෛද්‍යවරුන් මගින් ශ්‍රවණ උපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය පිරිවිතර සකස්කර ගැනීමෙන් සිදු වූ ප්‍රමාද දෝෂය නිසා වර්ෂය අවසන් වනතෙක් ශ්‍රවණ උපකරණ මිලදී ගැනීමේ කාර්යය සිදුකර ගැනීමට නොහැකි විය.

III. වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූලික කටයුතු සඳහා ඒ ඒ වෛද්‍ය අංශයන්හි සහයෝගයද ලැබිය යුතු බැවින් ඒ සඳහා දැරූ විවිධ උත්සහයන් අසාර්ථක වීම මත තත්කාර්ය 100%ප්‍රගතියක් කරා ගෙන යාමට නොහැකි විය.

2018 වර්ෂයේදී වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලින් මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති අතර මෙම අක්ෂි කාච ලබා දීම රජයේ රෝහල් සමඟ සම්බන්ධ වී සිදුකරන බැවින් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල සීමවන් හි ඉල්ලුම්කරුවන් සඳහා අක්ෂි කාච ලබා ගැනීමේ හැකියාවන් සහිත රෝහල් වල නාම ලේඛණයක් නම් කර එවන මෙන් ලිපි මගින් 2018.07.10 දිනැති ලිපියක් මගින් දැනුම් දී ඇත.

(ආ) පිළිකා රෝගීන් සඳහා අධාර ලබා දීම

2018/06/04 දින මහරගම අපේක්ෂා රෝහලේදී පවත්වන ලද පිළිකා රෝගී ප්‍රතිලාභීන් වෙත පෝෂණීය ආහාර, ශක්තිජනක කිරිපිටි වර්ග ආදිය ලබා දීමේ වැඩසටහන සාර්ථකව නිමකරන ලදී. (ඇමුණුම2)

(ඇ) පුහුණු පර්යේෂණ හා දැනුවත් කිරීමේ වැඩසටහන්

(i) මෙහිදී එක් වැඩසටහනක් පමණක් පවත්වා ඇති අතර ඉතිරි වැඩසටහනේ ප්‍රතිපාදනයන් යොදා ගනිමින් ආයතන සේවකයන්ගේ අධ්‍යාපන සුදුසුකම් ඉහළ නන්වනු පිණිස එක් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරියෙකුට පශ්චාත් උපාධිය හැදෑරීමට 2017 වර්ෂයේදී ශිෂ්‍යත්වයක් ලබා දී ඇත.

(ii) මෙහිදී මේ වන විට සමාජ සංවර්ධන ආයතනය මගින් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ සුදුසුකම් පරික්ෂා කිරීම සිදුකරගෙන යන අතර ඒ සඳහා වන අවබෝධතා ගිවිසුමක්ද ඉදිරියේදී අත්සන් කිරීමට නියමිතව ඇත.

(ඈ) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීම

වැඩිහිටි තැනැත්තන් පිළිබඳව නිවැරදි හා යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම හා ඒ පිළිබඳ අන්තර්ජාලයට ඇතුලත් කිරීමේ කටයුතු 2018/07/23 දින සාකච්ඡාවෙන් අනතුරුව ඉදිරියට කරගෙන යාමට කටයුතු කරන ලදී.

(ඉ) වැඩිහිටි දිනය පැවැත්වීම

i. මෙවැනි අතපසුවීම් හා ප්‍රමාද දෝෂ ඉදිරියේදී නොකිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
ii. 2018 වර්ෂයේ මාර්තු මාසයේදී කල පසුවිපරම් කටයුතුවලින් පසුව මේ වන විට තහවුරු කිරීමේ ලිපි බොහෝ ප්‍රමාණයක් ලැබී ඇත.
iii. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් හා ප්‍රමාද දෝෂයන් සිදු නොවීමට උපදෙස් ලබා දී ඇත.

(ඊ) වැඩිහිටි දිනය වෙනුවෙන් කොඩි හා ස්ටිකර් අලෙවිය

i. කොඩි බෙදා දීම සම්බන්ධව විගණනයට තොරතුරු ලබා දීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14න් කොඩි ලැබීම සම්බන්ධ වාර්තා ලැබී නොතිබූ අතර අදාල වාර්තා මේ වන විට ගෙන්වා ගැනිම සඳහා ලිපි යවා ඇත. එමෙන්ම මේ වන විට රු. 1,293,744/58 මුදලක් ලැබී ඇති බව දන්වමි. තව දුරටත් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් චෙක්පත් ලැබෙමින් පවතින අතර ඉන් දෝෂ සහිත චෙක්පත් නැවත හරවා යවා ඇත.

ii. කොඩි මුද්‍රණය හා බෙදා හැරීම, කොඩි අලෙවිය හා අලෙවි ආදායම එක්රැස් කර ගැනීම සම්බන්ධයෙන් වාර ගණනාවකදී දුරකතන මාර්ගයෙන් දැනුවත් කිරීම් මෙන්ම සිහිකැඳවීම් ලිපි මගින්ද දැනුවත් කර ඇත.

Iv. අදාල ස්ටිකර් අලෙවියෙන් ලද ආදායම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට කටයුතු නොකරන ලදි. මෙහි මූලික අරමුණ වූයේ ප්‍රාදේශීය බල මණ්ඩල සතු මූල්‍ය ප්‍රමාණය තර ගැනීමට අවශ්‍ය කටයුතු සලසාදීමයි. එමෙන්ම ස්ටිකර් මුද්‍රණ පිරිවැය රු. 159,753/-ක් අලාභයක් නොවන බව දන්වමි.

(උ) 2018 වර්ෂයේදී වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලින් මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති අතර එය ජාතික සභා අනුමැතියෙන් පසු ඉදිරියේදී සිදු කිරීමට නියමිතයි.

(ඌ) මහා භාණ්ඩාගාරය විසින් 2017 වර්ෂයට අදාලව ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය සීමාසහිත වීම මත උක්ත කරුණ වෙනුවෙන් වෙනම වැය ශීර්ෂයක් යටතේ සැලැස්මක් සකස් කිරීමේ හැකියාවක් නොතිබුනි. නමුත් මෙම වර්ෂය තුලදී වැඩිහිටි දිනයට සමගාමීව හොඳම වැඩිහිටි නිවාසය තේරීමේ තරඟය සූදානම් කර ඇති අතර ඉන්පසුව අදාල වැඩිහිටි නිවාස කාණ්ඩ කීපයකට ශ්‍රේණිගත කිරීමට අපේක්ෂිත අතර එම ශ්‍රේණිගත කිරීමෙන් පසුව වැඩිහිටි නිවාස සඳහා වාර්ෂික සැලැස්මක් සකස් කරන බව දන්වමි.

(ඒ)

I. වැඩිහිටියන් පිළිබඳව සමාජයේ වගකීම හා වැඩිහිටි වියේ සෞඛ්‍ය පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීම සිදු කර ඇත.

II. ඉදිරියේදී ඒ සම්බන්ධ වැඩසටහන් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි.

III. ඉදිරියේදී ඒ සම්බන්ධ වැඩසටහන් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි.

IV. මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් දැනටමත් සිදු කරමින් පවතී.

V. ඉදිරියේදී ඒ සම්බන්ධ වැඩසටහන් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි.

VI.වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් රක්ෂණ ප්‍රතිලාභ ලබා දීම සඳහා අදාල රක්ෂණ ආයතන සමඟ සාකච්ඡා පැවැත්වුවද එම රක්ෂණ ආයතන වැඩිහිටියන් සඳහා වූ රක්ෂණ සැලැස්මක් සැකසීමට කැමැත්තක් නොදක්වන ලදී.

VII. මෙම වර්ෂයේදී සමාජ ආරක්ෂණ අරමුදල යටතේ වැඩිහිටි සමිති සඳහා චක්‍රීය ණය අරමුදලක් ආරම්භ කිරීමට නියමිතව ඇත.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) වැඩිහිටියන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සැලකසීමට අදාල කටයුතු සිදු කර ඇති අතර මහජන අදහස් විමසීම් කටයුතුවලට අදාල මූලික කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.

(ආ) මෙම නඩුව සම්බන්ධව 2018/04/26 දින සාකච්ඡාවක් පවත්වන අතර එහිදී නැවත එම ඉඩම අප ආයතනය වෙත භාර දෙන්නේ නම් අරමුදල් වැය කර හොඳින් පවත්වාගෙන යා හැකි බව දන්වන ලදී.

4.3 මෙහෙයුම් ආකාර්යක්ෂමතාවය

(අ) වැඩිහිටි දීමනාව රු.2000න් නැවත රු.100/-ක් අය කර ගැනිමෙන් ගොඩනැගෙන සමාජ ආරක්ෂන අරමුදලේ සියලු මුදල් රාජය බැංකු 02ක අයෝජනය කිරිම මගින් එයින් ලැබෙන ප්‍රතිලාභද වැඩිහිටියන්ට ඉදිරියේදි ලැබෙන බව දන්වන අතර එම අරමුදල් වියදම් කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකසා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවෙන් අනුමැතිය ලබා ගත් පසු ඒ සම්බන්ධ සියලු කටයුතු ඉදිරියේදි සිදු කිරීමට නියමිතව ඇත.

(ආ) ස්ථාවර තැන්පතු කල් පිරීමෙන් පසුව පොලී අනුපාත බැංකුවලින් ලබා ගැනීමත් ඒවා ජාතික සභාවට යොමු කර අනුමැතිය ලබා ගැනීමත් යන කරුණු සඳහා දීර්ඝ කාලයක් ගත වීම නිසා මෙම ප්‍රමාදයන් සිදු වී ඇති බව දන්වා සිටිමි.

(ඇ) දෝෂ සහිත චෙක්පත් සියල්ල මේ වන විට අප වෙත ලබා ගැනීමට කටයුතු සිදු කර ඇත.

4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

2017/11/30වන දින පැවති ජාතික සභා අනුමැතියෙන් පසුව ප්‍රතිපූර්ණය කරන ලදි.

4.5 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

2018/06/11 තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා ඇති තොරතුරු පරිදි 2018/06/19 ඉල්ලූ තොරතුරුවලට පිළිතුරු සමඟ ලිපියක් යොමු කර ඇත. (ඇමුණුම 03)

4.6 කාර්යය මණ්ඩල පරිපාලන

(අ) සහකාර අධ්‍යක්ෂ(පාලන) තනතුර වැඩබැලීමේ පදනම මත පවතින පුරප්පාඩුවක් බැවින් දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් ඒ සඳහා කැමැත්තක් නොදක්වන බැවින් එම පුරප්පාඩුව තව දුරටත් ඉතිරිව පවතී.
(ආ) සහකාර අධ්‍යක්ෂ(තොරතුරු හා සන්නිවේදන) තනතුර අදාලව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අදාල කටයුතු දැනට සිදු කර ගෙන යන අතර ඒ සම්බන්ධව මේ වන විටත් සාකච්ඡා මට්ටමේ පවතී.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කිරීමට නිලධාරීන් 83ක් පමණ සීමිත පිරිසක් පමණක් සිටින බැවින් සමානුපාතිකව බෙදී යන අයුරින් මෙම නිලධාරීන් අනුයුක්ත කිරීමේ ගැටළුවක් ඇති බව දන්වා සිටිමි.

5. තිරසාර සංවර්ධන අරමුණු
තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට අදාල කාර්යයන් සිදු කිරීම සඳහා ආයතනය තුල ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් සතු නොවන අතර ඉදිරි වර්ෂවලදී එම කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් දැනුම හා සම්පත් ලබා දීමට කටයුතු කරන්නේ නම් මැනවි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
6.1 අභ්‍යන්තර විගණනය

2017 වර්ෂයේදී ආයතනය තුල අභ්‍යන්තර විගණන අංශයක් නොතිබූ අතර 2018 වර්ෂයේ සිට නව අභ්‍යන්තර විගණක නිලධාරියෙකු පත් කර ඇති බැවින් 2018 වර්ෂයේදී සියලු වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

6.2 ප්‍රසම්පාදනය
මෙම වර්ෂයේදී වැය කිරීමට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇති අතර එය පාලක සභාව පත්වූ පසු පාලක සභාවේ අනුමැතිය මත ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි.

6.3 අයවැය ලේඛනමය පාලනය
තත්‍ය ආදායම් හා වියදම්වල මනා පාලනයක් සඳහා පාලන කාරකයක් ලෙස වාර්ෂික අයවැය යොදා ගන්නේද යන්න නිරීක්ෂණය කරමි.

6.4 වාර්ෂික වාර්තා කෙටුම්පත
2018 වර්ෂයේදී අවසන් ගිණුම් සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

7. පද්ධති හා පාලන

ඔබ විසින් දක්වා ඇති පරිදි පද්ධති හා පාලන ක්ෂේත්‍ර හා ඊට අදාල නිරීක්ෂණ අනුව විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කරන බව දන්වා සිටිමි.

එම්.රාමමුර්ති
අධ්‍යක්ෂ
O/C